සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) ඊමානීය ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ii) අප දිනපතා ම උසුරිය යුතු යැයි නබි (සල්) තුමා පැවසූ සූරාහ් **දෙකක්** ලියන්න.

(iii) රාත්‍රී කාලයේ ඉටු කරනු ලබන සුන්නත් වූ සලාත **දෙකක්** සඳහන් කරන්න.

(iv) සකාත් ලැබීමට හිමිකම් ඇති කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.

(v) ඉස්ලාම්, කාන්තාවන්ට ලබා දී ඇති අයිතිවාසිකම් **දෙකක්** දක්වන්න.

(vi) ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ විද්වතුන් **දෙදෙනකුගේ** නම් ලියන්න.

(vii) ඉපැයීමේ දී තහනම් කර ඇති කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(viii) 'ෂිර්ක් අස්කර්' යන්නට උදාහරණ **දෙකක්** ලියන්න.

(ix) පිරිමියකුට විවාහ කර ගැනීම නැකමින් හරාම් වන කාන්තාවන් **හතරදෙනෙකු** නම් කරන්න.

(x) අභාවයට පත් අයකුගේ දේපළවලට හිමිකම් ලබන **දෙදෙනකු** සඳහන් කරන්න.

**2.** (i) ඊමානය දුර්වල කරන කරුණු **දෙකක්** ලියන්න.

(ii) විශ්වාසය හා සම්බන්ධ කුෆ්රයට උදාහරණ **තුනක්** දක්වන්න.

(iii) 'තයම්මුම්' කරන ක්‍රමය පැහැදිලි කරන්න.

**3.** (i) විවාහයේ 'ෆර්ල්' **දෙකක්** ලියන්න.

(ii) දරුවන් තම දෙමව්පියන්ට ඉටු කළ යුතු යුතුකම් **තුනක්** ලියන්න.

(iii) සලාතයේ වැදගත්කම පිළිබඳ ව විස්තර කරන්න.

**4.** (i) ඉස්ලාමීය ද්විතීය මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න.

(ii) හදීස් එක් නීතිමය මූලාශ්‍රයක් යන්නට සාධක **තුනක්** දක්වන්න.

(iii) සකාතයෙන් ලැබෙන ප්‍රයෝජන **පහක්** ලියන්න.

**5.** (i) මුජ්තහිද්වරයකු ලබා තිබිය යුතු සුදුසුකම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ප්‍රධාන සාපරාධී ක්‍රියා **තුනක්** ද ඒවාට අදාළ දඬුවම් ද සඳහන් කරන්න.

(iii) හුදයිබියා ගිවිසුමේ කොන්දේසි **පහ** කෙටියෙන් පැහැදිලි කරන්න.

**6.** (i) වෙළඳාමක් අනුමත කරනු ලැබීමට වෙළඳ භාණ්ඩවල තිබිය යුතු සුදුසුකම් **දෙකක්** ලියන්න.

(ii) ඉස්ලාම් තහනම් කර ඇති ආහාර වර්ග **හයක්** සඳහන් කරන්න.

(iii) හිජ්රත් සිද්ධිය විස්තර කරන්න.

**7.** (i) ශ්‍රී ලංකාවේ මුල් කාලයේ මුස්ලිම්වරුන් පදිංචි ව සිටි ප්‍රදේශ **දෙකක්** නම් කරන්න.

(ii) ජාතික සුභසිද්ධිය උදෙසා ශ්‍රී ලංකීය මුස්ලිම්වරුන් ඉටු කර ඇති දායකත්ව **තුනක්** සඳහන් කරන්න.

(iii) ඉස්ලාමීය කිලාෆතයෙහි උමෛයා පාලන සමයේ සිදු වූ වැදගත් සිදුවීම් **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...